24 භාගය.
2 කලාපය.

VOL. XX.
No. 2.

# ගොවිකම් සඟරාව.

# GOVIKAM SANGARAWA.

ර ට ක ම ව ගො වි ක ම වේ.

1929 අප්‍රේල්—ජූනි. APRIL-JUNE, 1929.

## අපේ ප්‍රධාන ගොවිතැන්.

## Our Staple Products.

ලංකාවෙ ප්‍රධාන කර්මාන්තය නම් ගොවිතැනය. මෙය අප විසින් නොකීවාට පුරාණ සිටම ව්‍යවහාරයෙන්ම දැනගෙන තිබෙන කරුණකි. පුරාණයේ සිටම කරගෙණආ ගොවිතැන්වලින් ප්‍රධානව තිබුණේ ආහාර පිණිස වවනු ලබන ගොවිතැන්ය. එම නිසා මෙරට වැසියෝ පිටරටකට වාල්නොවී ආහාර පිණිස ධාන්‍ය වර්ග උපදවාගත්හ. නුමුත් පිටරටවල් සමග සම්බන්ධකම වැඩිවීම කාරණකොටගෙණ ආහරවලට උවමනා ධාන්‍ය වර්ග ගෙන්වා ගැණීම පහසුවූයෙන් ක්‍රම ක්‍රමයෙන් ධාන්‍ය ගොවිතැන හීනකිරීම කාරණකොටගෙණද මෙරට ආහාර ද්‍රව්‍ය ලබාගැණීමට පිට රටට වාල්වෙන්ටවීතිබේ. එහෙයින් තවත් පිටරට සමග ආශ්‍රය ඇතිවීමෙන්

ජනා ආහාරගැණ නොසයා පිටරටවලට උවමනා භාහිර ද්‍රව්‍ය වවා මිල දීණීම එසේම භාවිතාකරගෙණයත්. මෙහි ප්‍රතිඵලය නම් පිටරටවල මිල උස් පහත්වීමේක්‍රමයට අපේ බඩු විකිණීමද ඉහළ පහළයෑමය. එයින් සිදුවී තිබෙන දෙය නම් ආහාර පිණිස ද්‍රව්‍ය ලබාගැණීමට පිටරට ගැණ බලාපොරොත්තු වන අතරම අප වවනදේ විකිණීම ගැණද පිටරට ගැණ බලාපොරොත්තුවෙන්ට වීමය. මේ කාරණා දෙක ගැණ ඉතා පරීක්ෂාකාරීව අප ගොවීන් විසින් කල්පනා කළයුතුය. එසේ කල්පනාකොට මේ ගොවිතැන් දෙවියීයම රටේ සුභ සිඩිය සිදුවන අන්දමට වඩීනයකරගත යුතුව තිබේ.

ආහාර පිණිස වගාකරණ බෝග බොහොමත්ම අඩුය. පිටරට යවන බෝග බොහොමත්ම වැඩිය. වැඩිවී තිබෙන දෙයින් අඩුකර අඩුවී තිබෙන ගොවිතැන වඩා සැලකිල්ලක් ඇතිකර වැඩිදියුණුකරන්නේ නම් එකකින් වන හානිය අනිකෙන් පිරිමසාගන්ට පුළුවන් වෙනවාට නොඅනුමානය.

තවද මේ වැඩ ගැණ කීප අතකින් වැඩකරගෙණයත්. එනම් මේ ගොවිතැන ගැණ විශෙෂ පරීක්ෂණ සභා ඇතිකිරීමය. තේ පරීක්ෂණ සභාවක්ද, රබර් පරීක්ෂණ සභාවක්ද ඇතිකර ඊලඟට පිටරට යවන ද්‍රව්‍යයක්වූ පොල් වැවීම ගැණද දැන් පරීක්ෂණ සභාවක් ඇතිකර තිබේ. මේ තුන් වර්ගය පිටරට යැවීම පිණිසම වාගේ වවනු ලබන ද්‍රව්‍යය. මීලඟට අපට ඇතිවිය යුත්තේ කුමක්ද ? ආහාර හෙවත් වී ගොවිතැන පිළිබඳ පරීක්ෂණ සභාවක්ද ? මේ පිළිබඳ ඇතිවූ සතුටුදායක කාරණ නක් නම් පසුගිය කාලාපයේ සඳහන් ප්‍රකාර වී ගොවිතැන් පිළිබඳ විශෙෂයෙන් පරීක්ෂාකොට රපෝර්ත කිරීමට පත්කරණලද කාරක සභාවය. මේ සභාවේ වාර්තා වලින් වී ගොවිතැන පිළිබඳ පරීක්ෂණ සභාවක්ද ඇතිවෙන්ට කාරණා සිදුවේදෝ සීයා අපේ බලාපොරොත්තුවය. එසේ වුනිනම් අපේ අදහස්වල ප්‍රකාර ප්‍රධාන ගොවිතැන් දියුණුවීමට හේතුවේ.

N. W.